

# මගේ ළමාවියේ මා හා ගැවසුණු මිතුරා කෝ?






**ප්‍ර**වීන ජනප්‍රිය ගායන ශිල්පි එමෙන්ම දක්ෂ සංගීත අධ්‍යක්ෂකවරයෙකුද වන ග්‍රේෂන් ආනන්ද කලාකරුවාණන් දැනට දෙමසකට පෙර අකාලයේ වියෝවුණු පුවත අසා ශ්‍රීලංකාවේ පමණක් නොව ලොව පුරා නා නා දිග් භාගයේ සිටිනා ඔහුගේ රසික සමූහයා අප්‍රමාණ ශෝකයට පත් වූහ. එය මටද ඉමහත් දුකක් වූයේ මා ග්‍රේෂන් ඉතා සමීපව දැන සිටි නිසයි. ඔහු මගේ ළමා කාලයේත් තරුණ වියට එළඹුණු පසුවත් සමීප මිතුරාව සිටියේය. ග්‍රේෂන් අබේකෝන් වන ඔහුගේ ගම මහනුවරය. එහෙත් ඔහු කුඩා කාලයේම නුවරින් ඇවිත් තිබුණි. මා කුඩා කල ජීවත් වූ කොලොන්නාව ගමේ ග්‍රේෂන්ද ජීවත් වූ නිසා එකල අප වැල්ලම්පිටියේ සිට පාසැල් ගියේ එකම බස් රථයෙනි. ඔහු නිතර මගේ නිවසට ආ ගිය අතර, මම ද ඔහු සොයා නිතර ඔහුගේ නිවසට යන්නට පුරුදුව සිටියෙමි.

එය හැටේ දශකයේ අවසාන කාලය හා හැත්තෑවේ දශකයේ මුල් යුගයයි. ග්‍රේෂන් බොක්ස් ගිටාරයක්ද උස්සාගෙන අපේ නිවසට නිතර එයි. ඒ මුල් කාලයේත් ගායනයට ඔහු සතු හැකියාව ප්‍රකටව පෙනිණ. ඔහු ගිටාරය වයමින් ඒ යුගයේ මිල්ටන් මල්ලවාරච්චිගේ ජනප්‍රිය ගී මිල්ටන් මෙන්ම හොඳට ගැයුවේය. ජෝතිපාල අනුකරණය කරමින් මවාගත් ගැඹුරු කටහඬින් ජෝතිගේ ගී ගයා අප පිනවූ හැටි මට තවම මතකය.

අද මෙන් එකල හැම ගෙදරකම ගී පටිගතකරන පහසුකම් නොවූයේය. එහෙත් මගේ ළඟ පුංචි කැසට් යන්ත්‍රයක් තිබුණි. මගේ කාමරයට වැදී ග්‍රේෂන් ගිටාරය වයමින් ගැයූ ගී මම ඒ කුඩා කැසට් යන්ත්‍රයේ පටිගත කළෙමි. ඒය අපට ඉතා ප්‍රිය ජනක අත්දැකීමක් විය. එසේ වරින් වර පටිගත කළ ඔහුගේ හඬෙහි වැරදි තැන් අඩුපාඩුකම් නැවත නැවතත් ඇසීමෙන් හා මැකීමෙන් හා යළිත් පටිගත කිරීමෙන් ග්‍රේෂන් ඉතා මහන්සියෙන් නිවැරදි ගායනා විලාශයක් හා ඔහුටම ආවේණික ශෛලියක් ගොඩනගා ගත්තේය.

1972 දී වැල්ලම්පිටියේ අපේ හොඳ මිතුරෙකු වූ උපාලි හිරිපිටියගේ ග්‍රේෂන්ට උදව්කරන්නට ඉදිරිපත්වූයේය. ඔහු ග්‍රේෂන්ගේ ගීත කීපයක් සැබෑ ශබ්දාගාරයක පටිගත කරවා දෙන්නටත්, එයට යන වියදම් දරන්නටත් පොරොන්දු වූයේය. ඒ අනුව පුංචි බොරැල්ලේ කේරී විදුහල අසල ඇති බිෂොප් නිවසට අයත් ජෝනෙත් ශබ්දා ගාරයේ දී ග්‍රේෂන්ගේ මුල්ම ගායනා හතරක් ඩොනල්ඩ් අයිවන් විසින් පටිගත කරන ලදී.

අපි ස්කෝල ගමන මග හැර ග්‍රේෂන්ගේ එම ප්‍රථම ප්‍රයත්නය දකින්නට ජෝනෙත් ශබ්දාගාරයට ගියෙමු. ඒ ගීත සැබැවින්ම කන්කළුය. ග්‍රේෂන් ඇතුළු අප කාගේත් සතුට ඉහවහා ගියේය. එහෙත් එම ටේප් පටය ගුවන් විදුලියට දුන් නමුත් කිසියම් නොදන්නා හේතුවකින් එහි වාදනය වූයේ නැත. ඒ ගීත තැටියකට ගන්නට තරම් එදා අපට වත්කමක් ද නොවූයේය.

මේ කාලයේ ග්‍රේෂන් කොළඹ ආනන්ද බාලිකාවට යන සිසුවියක වන ශ්‍රීමා සමග පෙමෙන් වෙලුණේය. ඇය වෙනුවෙන් ඔහු ගැයූ ගීයක් ඇත. ඒ ඇත දුරක දැස පාවෙලා යන ගීයයි. පසු කලෙක ඒ ශ්‍රීමා ඔහු ගේ ආදරණීය බිරිඳ වූයේය.

ග්‍රේෂන් මූලික වශයෙන් ගිටාර් වාදකයෙකු වූ නමුත් ඔහුට පියානෝ, සර්පිනා වයලීන ඇතුළු බොහෝ වාදන භාණ්ඩ මනාව වාදනය කරන්නට හැකි නිසගයෙන් ලත් දසකමක් තිබුණි. ඔහු සරත් දසනායක හා ස්ටැන්ලි පීරිස් යන සංගීතඥ ගුරු ඇසුරේ සිය හැකියාව තවත් ඔප මට්ටම් කරගත්තේය.

1977 දී මම ශ්‍රීලංකා ගුවන්විදුලි සංස්ථාවේ කාර්මික ශිල්පියෙකු ලෙස එහි සේවයට බැඳුණෙමි. ඒ නිසා ගුවන්විදුලියේ බොහෝ වැඩසටහන් මෙහෙයවූ අය දැන සිටියෙමි. ආරියසිරි විතානගේ, කුසුම් පීරිස්, ධර්ම ශ්‍රී වික්‍රමසිංහ, විජය කොරයා, නිහාල් භාරතී, හැරල්ඩ් ප්‍රනාන්දු ආදී එම සිංහළ හා ඉංග්‍රී සේවයන්හි සම්පාදකවරුන්ට ආයාචනා කොට ඔවුන්ගේ වැඩසටහන් වල ග්‍රේෂන්ගේ ගීත වාදනය කරවූයෙමි. එකල ගුවන්විදුලියේ තේරීම් මඩුල්ලක්ද වූයේය. එයට පී. එල්. ඒ. සෝමපාල, මඩවල එස් රත්නායක, දයානන්ද ගුණවර්ධන ආදී පිරිසක් ඇතුළත් වූහ. ගීත වාදනය කරන්නට පෙර ඔවුන්ගේ අනුමැතිය ලබාගතයුතු වීය. මේ සියළු බාධක මැඩගෙන ග්‍රේෂන්ගේ ගීත නිතර වාදනය වන්නට මම සැළැස්සුවෙමි. එවැනි දෙයක් මිතුරෙකු වෙනුවෙන් කරන්නට ලැබීම ගැන මම අදත් සතුටු වෙමි.

ග්‍රෂන් එක්සත් රාජධානියට ආ දෙවාරයන්හිද මට ඔහු හමු විය. ඔහුගේ ගීත හා සංගීතය ප්‍රිය කරන්නේ අපේ පරම්පරාවේ අය පමණක් නොව, නව පරපුරේ අයද ඔහුගේ ගායනාවන්ට ඇළුම් කරන බව මම දැන සිටිමි.

අවසන් වරට මට ග්‍රේෂන් හමුවූයේ 2009 දී මා නිවාඩුවකට ගෙදර ගිය වෙලේ කොලොන් නාවේ ටවුමේදීය. කොලොන්නාව මහ වීදියේ ගමන්කරමින් සිටි ඔහු මා ඇමතූ හඬින් පාරද පැන දුවවිත් මා බදා වැළඳ කරට අත දා කොහොමද මචං යන සුහද වචනයෙන් ඇමතුවේය.

ග්‍රේෂන් හොඳ කලාකරුවෙකු දක්ෂ සංගීතඥයෙකු පමණක් නොව යහපත් ගුණගරුක මිනිසෙක්ද විය. තමාට අතහිත දුන් කිසිවෙකු ඔහු අමතක නොකළේය. ඔහු සිය දරුවන්ට ආදරණීය පියෙකු හා ශ්‍රීමාට දයාබර සැමියෙකු වීය. එසේම ඔහු ඇසු කළ අපට වටිනා මිතුරෙකු වීය. ශ්‍රීලංකා කලා ලෝකයට වටිනා කලාකරුවෙකු අහිමි විය. මට මගේ ළමාවියේ සිටි මිතුරා නැතිවිය.

ග්‍රේෂන් හිතවතාණන්ට උතුම් නිවන් සැප ලැබේවා !

♦ **සිසිර චන්ද්‍රසේකර**
**Edgware Middx UK**

## උඹ හොඳ නඩු අහන්න නෙවෙයි තණකොළ කන්න.. ගිහිං තණකොළ කාපං......

### සැකකරු නඩුකාරයාට කියයි



**ව**සර හතර හමාරක් කිසිදු චෝදනාවක් ගොණු කිරීමෙන් තොරව ඇප ලබා නොදී සිටි සැකකරුවෙක් පසුගිය දා පූගොඩ උසාවියේදී මහෙස්ත්‍රාත් අරවින්ද පෙරේරා මහතා අමතා තමාට ඇප නොදෙන්නේ කවර කරුණක් නිසාදැයි විමසා ඇති අතර, ඊට මහෙස්ත්‍රාත්වරයා පිළිතුරු නොදී නිහඬ ව සිටිද්දී සැකකරු නැවත වරක් "ඇයි මට විතරක් ඇප නොදෙන්නේ... මාත් එක්ක අල්ලපු හැම එකාම නිදහස් කරලා තියෙද්දී" යනුවෙන් ප්‍රකාශකොට ඇති අතර, එවිට මහෙස්ත්‍රාත්වරයා පවසා ඇත්තේ අධිකරණ කටයුතු පිළිබඳ තීරණය කරන්නේ තමා බවත්, ඒ බව ප්‍රශ්නකිරීමට කාටවත් අයිත යක් නැතිබවත් ය. එය පැවසූ විගස උරණවී ඇති සැකකරුවා "උඹට වැඩ බැරිනම් පුළුවන් එකෙකුට දීලා බැහැලා පලයන්..." යයි කියා ඇති අතර, ඉන් කෝපයට පත් මහේස්ත්‍රාත්වරයා ඒ මොහොතේම සැකකරු උසාවියට අපහාසකිරීමේ වරදට සැකකරු වසර තුනකට බන්ධනාගාරයට නියම කර තිබේ.

එය ඇසෙත්ම දැඩි ලෙස උරණවූ සැකකරුවා "උඹ හොඳ නඩුඅහන්න නෙමේ... තණකොළ කන්න... ගිහින් තණ කොළ කාපන්..." යනුවෙන් පවසා ඇති අතර, මේ සිද්ධියෙන් මුළු උසාවියම තුෂ්ණිම්භූතව බලා සිටින්නට වූයේය. සැකකරුගේ ප්‍රකාශයෙන් කෝපයටත් ලැජ්ජාවටත් පත් මහෙස්ත්‍රාත් අරවින්ද පෙරේරා සැකකරුගේ කටට පහර දෙන ලෙස ජේලර්වරයෙකුට අණ කොට පහර දීමට සළස්වා තිබේ.

පසුගිය දා පූගොඩ මහෙස්ත්‍රාත් උසාවියේ සිදුවූ මෙම සිද්ධිය මාධ්‍යයේ වාර්තා වෙද්දී ජ්‍යේෂ්ඨ නීතිවේදියෙක් පවසා ඇත්තේ උගත් මහෙස්ත්‍රාත්වරයාගේ නීතිය පිළිබඳ නොදන්නාකම මේ සිද්ධියෙන් අනාවරණය වූ බවයි.

වැඩිදුරටත් කරුණු දැක්වූ නීතිඥවරයා කියා ඇත්තේ අධිකරණයට අපහාසකිරීමේ වරදට දඬුවම් කරන ආකාරය අපරාධ නඩුවිධාන සංග්‍රයේ සහ අධිකරණ සංවිධාන පනතේ ප්‍රකාශිත වම දක්වා ඇති අතර, මේ කාරණයේ දී මේ ගරු මහෙස්ත්‍රාත්වරයා තමන්ගේ නඩුව තමන්ම ඇසීමෙන් ස්වාභාවික යුක්ති රීතිය මුළුමනින්ම උල්ලංඝණය කර ඇති බවයි. එමෙන්ම සැකකරුවාට ජේලර්වර යෙකු ලවා විවෘත උසාවියේ පහර දීමෙන් මහේස්ත්‍රාත් වරයා සැකකරුට වඩා ආවේගශීලී වීමෙන් තම ගරු නිලයට හානි පමුණුවාගත් බවයි.

# International Students & Points Based System

## By Colvin L. De Silva

United Kingdom Border Agency is the executive agency controlling the borders of the country and regulates immigration. In 2008, it introduced the Australian style Points Based System in order to streamline and regulate immigration policies and procedure rules.

When the present coalition government came into power it said that the country needed a stricter and a fairer system of immigration and adopted a policy of cutting back on international students. Tighter visa regulations meant fewer students from non-EU countries. It must be said that the international students brought in a massive £2.6 billion into the country by way of tuition fees and around £8.2 billion worth of overall business into much affected economy.

Under the 5 Tier points based system, you need to pass a points based assessment and international students from non-EU countries come under Tier 4. These students need to contact regulated educational establishments and obtain a certificate of sponsor ship, which gives them a score of 30 points. Another 10 points has to be obtained by showing evidence of the availability of maintenance funds. Proficiency in the English Language is an essential requirement to study in the UK and to get through the visa application process. The British Council in your country of origin will provide accurate information to help international students to prepare for study in the UK. It should be your first port of call.

Those who come under the scheme need to understand the rules and regulations very carefully to make sure that you do not get into traps. By enrolling to follow short courses do not allow you to bring your families to the UK. One has to be registered with a Higher Educational institution in order to bring your family to the UK. Working 20 hours per week is allowed if you are registered on a degree level (or higher) course otherwise restrictions apply.

**( Colvin L De Silva is an accredited immigration Advisor in the UK Colvindesilva 121 @ gmail.com ( Mob: 07956 502019 )**



## අජන්තා මෙන්ඩිස් විවාහවෙයි

**ශ්‍රී** ලංකා සුපිරි ක්‍රිකට් ක්‍රීඩක වේග පන්දු යවන අජන්තා මෙන්ඩිස් ජනවාරි 6 වෙනි දින කොළඹදී යෝෂිනී ද සිල්වා සමග විවාහවිය. යෝෂිනී පොලිස් අධිකාරී චූලා ද සිල්වාගේ දියණියයි. සහභාගි වූ අය අතර ජනාධිපතිවරයාද විය.



## ක්‍රිකට් බෝලයේත් පිරිත් නූල් ඔතති!

**ක්‍රි**කට් වර්ල්ඩ් කප් හෙවත් ලෝක ශූරතා ක්‍රිකට් තරඟ ලබන සතියේ සිට පැවැත්වේ. ශ්‍රීලංකාවද එහි සත්කාරක රටකි. ලංකාවේ තරඟ කීපයක්ම පැවැත්වෙන අතර හම්බන්තොටද කඩිමුඩියේ ක්‍රිකට් පිටියක් අළුතින් තැනුවේ ඒ සඳහා මය. ශ්‍රීලංකාව ක්‍රිකට්වලට පිස්සු වැටුණු රටක් බව අපි දනිමු. මේ පින්තූරයෙන් දැක්වෙන්නේ තිස්සමහාරාමයේ භික්ෂූන් වහන්සේලා දෙනමක් පසු ගියදා ඉහතකී පිටිය විවෘතකරන අවස්ථාවේ ක්‍රිකට්බෝලයට පිරිත් නූල් ඔතන ආකාරයයි. පිරිත් බලයෙන් අප වර්ල්ඩ් කප් එක දිනන්නත් බැරි නැත.හින්දු පූජකවරයා උපහාසයෙන් බලා සිටී.